

ධම්මං පීති සුඛං සේති විප්පසන්නේන චේතසා
(දහම් රස බොන්නෝ සුවසේ තිසි වෙසෙන්නෝ)

# බෞද්ධ සංගමය


## ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය

අංක : 234, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
කොස්වත්ත, බත්තරමුල්ල
දුරකථන : 011 2864134

**ප්‍රධාන අනුශාසක :**

බත්තරමුල්ල සිරි සුදස්සනාරාමාධිපති පූජනීය ආචාර්ය
මිරිස්සේ ධම්මික හිමි



**බු.ව 2553 වප් පොහොය** සදහම් පත්‍රිකා අංක **09**

**උතුම් චතුරාර්‍ය සත්‍ය අවබෝධ වීමට සඳහම් පඬුරකි**


## බෝධි අංග නොවඩන්නා නීවරණවලට හසුවෙයි

නමෝ්තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස
නමෝ්තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස
නමෝ්තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස

**"යස්මිං බො බ්‍රාහ්මණ, සමයේ කාමරාග පරියුට්ඨිතේන,
චේතසා විහරති කාමරාග පරේතේන. උප්පන්නස්ස ච
කාමරාගස්ස නිස්සරණං යථාභූතං නප්පජානාති.
අත්තත්ථම්පි තස්මිං සමයේ යථාභූතං නජානාති න පස්සති
පරත්ථම්පි තස්මිං සමයේ යථාභූතං න ජානාති, න පස්සති
උභයත්ථම් පි තස්මිං සමයේ යථාභූතං න ජානාති, න පස්සති"**

**"බ්‍රාහ්මණය, යම් කලෙක කාමරාගයෙන් මඩනා ලද, කාමරාගී සිතින් යුතුව වාසය කෙරේද, හටගත් කාමරාගය දුරු කිරීමත් නියම ආකාරයෙන් නොදනී ද, එවිට ආත්මාර්ථයත් නියම ආකාරයෙන් නොදනී, නොදකී. එවිට පරාර්ථයත් නියම ආකාරයෙන් නොදනී, නොදකී එසමයෙහි උභයාර්ථයම නියම ආකාරයෙන් නොදනී, නොදකී"**

කාරුණික වූ පින්වත්නි,

ඉහත සඳහන් කරනු ලැබුවේ සංයුත්ත නිකායෙහි බොජ්ඣංග වර්ගයෙහි සඳහන් සංගාරව සූත්‍රයෙහි සඳහන් උතුම් ධර්ම කොටසකුයි. කාමරාග ආදී කෙලෙස්වලින් පීඩිත මනසක් ඇති අයෙකුට හොඳ නරක හෝ පව් පින් හෝ කුසල් අකුසල් පිළිබඳ අවබෝධයක් නොමැති බව මින් පැහැදිළි කෙරේ.

දිනක් ඒ භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ වෙතට පැමිණුනු සංගාරව බ්‍රාහ්මණයා බුදුරදුන්ට මෙසේ පැවසීය. "යම් දවස්වල දිගු කලක් පුරා නොහදාළ මන්ත්‍ර තබා හදාළ මන්ත්‍ර පවා නොවැටහේ. එයට හේතුව කුමක් ද ? ප්‍රත්‍ය කුමක් ද ? භවත් ගෞතමයාණන් වහන්ස, ඇතැම් දිනවල දිගු කලක් හදාළ මන්ත්‍ර පමණක් නොව හදාළ නැති මන්ත්‍ර පවා වැටහේ. එයට හේතුව කුමක් ද ? ප්‍රත්‍ය කුමක් ද ?මෙහිදී භාග්‍යවතුන් වහන්සේ පිළිතුර දෙති. අප මෙහි ආරම්භයේදී සඳහන් කළ ධර්ම කොට්ඨාශය බුදුරජාණන් වහන්සේ විසින් දේශනා කරමින් උපමාවකින් ද එය තවදුරටත් පැහැදිළි කරති. බ්‍රාහ්මණය, යම්සේ දිය බඳුනක් ලාකඩ පැහැයෙන් කහපාටින්, නිල්පාටින් හෝ මදටිය පාටියෙන් යුක්ත වේද ? ඇස් ඇති පුරුෂයෙක් විසින් තමාගේ මුහුන එහි බැලුවත් නියම අයුරින් නොපෙනේ.



www.buddhismforyou.org

බ්‍රාහ්මණය එසේම කාමරාගයෙන් මඩනා ලද සිත් ඇති අයෙක් ආත්මාර්ථය, පරාර්ථය හෝ උභයාර්ථයම නොදනී. නොදකී, දිගු කලක් පුරුදු කරන ලද මන්ත්‍ර නොවැටහේ. නොහදාළ මන්ත්‍ර සියල්ලම නොවැටහේ.

මෙහිදී අපට අවබෝධයෙන් මෙනෙහි කළ හැකි ධර්ම අවවාදය කුමක් ද ? පඤ්ච නීවරණයවල පළමු නීවරණය වූ කාමරාගයෙන් සිත වික්ෂිප්ත වූ තැනැත්තාට හොඳ නරක නොවැටහෙන බවයි. තමාට හෝ අනුන්ට සිදුවන අනර්ථය පිළිබඳ වැටහීමක් නොදැනේ . එමෙන්ම සිදුවන අනර්ථය නොපෙනේ. මෙය කොපමණ නම් හැබෑම වූ කරුණක් ද ? කාම රාගය නිසා ගුණ පදවි බඳු වූ මවු පදවිය, පිය පදවිය විනාශ කරගනිති. ස්වාමි දියණිවරු සහ ස්වාමි පුත්‍රවරු ඔවුනොවුන්ට වංකව එරෙහි වෙති. මෙහිදී අදහස් කළේ කාමරාගය විසින් දෛනික ජීවිතයේ පඤ්චසීලයෙන් බැහැරට ගමන් කොට ඉන්ද්‍රියන්හි අවිනීතව සහ අසංවරව හැසිරෙන බවයි. කාමරාගය පාලනය කරගත නොහැකිව, පවුල් පරිසරයෙන්ද, සමාජ පරිසරයෙන් ද, ධර්මයෙන් ද පිරිහුණු උගත්, නූගත්, ධනවත් සහ දිළිඳු බොහෝ පිරිස් සමාජයෙහි දැකගත හැකිය. අධ්‍යාපනය ලබන දරුවෙකුට වුවද අනාගත අභිවෘද්ධිය පිළිබඳ සිතන තරුණ දරුවෙකුට වුවද යහපත් වූ සදාචාරාත්මක පවුල් ජීවිතයක් ගැන සිතන ස්වාමි භාර්යාවන්ට පමණක් නොව පැවිදි උතුමෙකුට වුවද කාමරාගය බලවත්ම නීවරණයකි. දහම් මග වනසන මිනිස් ගුණ හීන කරන බලවත්ම ක්ලේශයයි. නීවරණ නම් යහපත් වූ මගට බාධාකරන යන අදහසයි.

භාග්‍යවතුන් වහන්සේ නැවත දේශනා කරති "යම් කලෙක ව්‍යාපාදයෙන් මඩනා ලද ව්‍යාපාදයෙන් යුතු සිතින් යුතුව වෙසේද සිතේ උපන් ව්‍යාපදය නියම ආකාරයෙන් දුරු කිරීමක් නොදනීද, එවිට ආත්මාර්ථය හෝ පරාර්ථය නියම ආකාරයෙන් නොදනී. නොදකී. මෙහිදී දිගු කලක් නොහදාළ මන්ත්‍ර තබා හදාළ මන්ත්‍ර පවා නොවැටහේ. බ්‍රාහ්මණය, යම්සේ දිය බඳුනක් ගින්නෙන් තැවුනේ, කැකෑරුනේ උණුසුම් ඇත්තේ ද එවිට ඇස් ඇති පුරුෂයෙක් එහි මුහුණ බැලුවද නියම ආකාරයෙන් නොදන්නේ ය. නොදක්නේ ය. එමෙන් ව්‍යාපාදය හෙවත් තරහ සිතින් යුතුව වෙසෙන්නාට තමා කෙරේ හෝ අනුන් කෙරේ හෝ උභයාර්ථයක් නියම අයුරින් නොවැටහේ, නොපෙනේ"

මෙහිදී ඉතාම පැහැදිළි කරුණක් විස්තර කළ යුතුය. එනම් ඔබට සහ අප සියලු දෙනාටම ව්‍යාපාදය පිළිබඳ බොහෝම අත්දැකීම් තිබේ. තරහ සිතුවිලි පවතින විට සිත නොසන්සුන් ය. තරහ සිතුවිල්ල සමග වෛරය, ක්‍රෝධය සහ පළි ගැනීමේ සිතුවිලිද දිගින් දිගටම පහළ වීමට අවස්ථා තිබේ. මෙම අවස්ථාවේ තරහ සිතින් යුතුව කටයුතු කිරීම නිසා තමාට සහ අනුන්ට සිදුවන අයහපත නොවැටහේ. ගිහි ජීවිතයක නම් පවුලේ පටන් මහත් විනාශයක් ඇති විය හැකිය. බොහෝ සණ්ඩු දබර, කල කෝලාහල සහ ජීවිත හානිවලට පවා එක් හේතුවක්, වන්නේ තරහවෙන් පීඩිත වූ සිත නොවේදැයි ඔබම සිතා බලන්න. තරහ සිත පවතින විට කළයුතු නොකළ යුතුදේ අමතකය. සිත එක් අරමුණක පවත්වා ගැනීමට නොහැකිය. මෙම තරහ සිතුවිලි පළමුව තමාටද දෙවනුව අන් අයටද විනාශය හෝ විපත් කැඳවයි. ගින්නෙන් උණුසුම් වන විට කැකෑරෙන යමක් සේ තරහ සිතද රත්වෙමින් තමාගේ සිතට ද කයට ද පීඩා පමුණුවයි. තරහ සිතින් සිටින්නා අමනාපයෙන් බලයි. අමනාපයෙන් කතා කරයි. අමනාපෙයන් හැසිරෙයි. ඔහුට හෝ ඇයට ද තරහව නිසා නින්ද නොපැමිණෙයි. සාපිපාසාව විටෙක නොදැනෙයි. ඉතාමත් සමීපව කටයුතු කරන දෙමව්පියන් දරුවන් සහ ස්වාමි භාර්යාවන් පවා මහත් විනාශයන් සිදුකරගන්නේ මෙම තරහව නිසා නොවේද ?



www.buddhismforyou.org

බුදුරජාණන් වහන්සේ මීළඟ කරුණ දේශනා කරති "බ්‍රාහ්මණය, යම් කළෙක ථීන මිද්ධයෙන් (සිතේ ඇතිවන අලස බව හා මලානික බව) මඩනා ලද හා අලස බවින් යුතු සිතින් යුතුව වෙසේද එමෙන්ම ථීනමිද්ධයේ නිස්සරණය හෙවත් මිදීම නියම ආකාරයෙන් නොදන්නේ ද, එවිට ආත්මාර්ථය නොදනී. නොදකී. පරාර්ථය නොදනී, නොදකී. උභයාර්ථයම නොදනී, නොදකී. දිගු කලක් මුළුල්ලේ හදාළ මන්ත්‍ර පවා නොවැටහේ. නොහදාළ මන්ත්‍ර ගැන කුමක් කියන්න ද ? යම්සේ දිය බඳුනෙක් සෙවල වලින් හාත්පසින් වැසුනු විට ඇස් ඇති පුරුෂයෙක් එහි මුහුන බැලුවත් නියම ලෙස නොදැනේ, නොදකී."

සිතේ අලස බව හෝ නිරන්තර නිදිමත හෝ අඳුරු බැවින් යුතු තැනැත්තාට හෝ තැනැත්තියට තමාගේම යහපත වෙනුවෙන් කළ නොකළ යුතු දේ නොවැටහේ. මනසින් දකින්නට ද නුපුළුවන. අනාගතය ගැන සිතන්නෙකුට උත්සාහය, අධිෂ්ඨානය, නිදි වැරීම, වීර්ය සහ ප්‍රඥාව තිබිය යුතුය. අලස සහ මැලවුනු සිතුවිලි ඇත්තාට එවැනි වීර්යක් හෝ අධිෂ්ඨානයක් ඇතිකර ගත නොහැකිය. ධර්ම මාර්ගයේ ගමන් කරන්නට ද වීර්ය, අධිෂ්ඨානය, නිදිවැරීම සහ ප්‍රඥාව මනාව තිබිය යුතුය. එසේ නොමැති වූ විට අධ්‍යාත්මික දියුණුවක් ඇතිකරගත නොහැකිය. තමාට යහපතක් කරගැනීමට නොදන්නා අනුන්ට යහපතක් සළසන්නේ කෙසේද ? අධ්‍යාපනයේදී ගෘහස්ථ ජීවිතයේ රැකියාවේදී, ගෙදොර දොර කටයුතු වලදී මෙන්ම ආගමික ජීවිතයේ ද සංවර්ධනය පිණිස ථීනමිද්ධයෙන් මිදීම හෙවත් බැහැර වීම අවශ්‍යයය.

බුදුරජාණන් වහන්සේ හතරවන කරුණක් දේශනා කරති. "බ්‍රාහ්මණය, නැවත අනෙක් කරුණක් දේශනා කරමි. උද්ධච්ච කුක්කුච්චයෙන් (සිතේ නොසන්සුන් බව සහ විසිරයාම) මඩනා ලද සහ නොසන්සුන් සහ විසිරුණු සිතින් යුතුව වෙසේද. එමගින් බැහැරවීමත් නොදන්නේද එවිට ආත්මාර්ථය නියම ආකාරයෙන් නොදනී, නොදකී. පරාර්ථය ද නියම ආකාරයෙන් නොදනී. නොදකී. උභයාර්ථයම නොදනී, නොදකී.දිගු කලක් මුළුල්ලේ නොහදාල මන්ත්‍ර තබා හදාළ මන්ත්‍ර පවා නොවැටහේ. බ්‍රාහ්මණය, යම්සේ දියබඳුනෙක් සුළඟින් කම්පිත වූයේ ද සැළුනේ ද, හටගත් රළ ඇත්තේද, එවිට ඇස් ඇති පුරුෂයෙක් බඳුනෙහි තම මුහුණ නියම ආකාරයෙන් නොදන්නේය. නොදක්නේය. එබැවින් සිතේ නොසන්සුන් බව සහ විසිරුණු බවින් යුතු වූයේ ද නිස්සරණය ද නොදන්නේද ඔහු හෝ ඇය ආත්මාර්ථය නොදනී. නියම ආකාරයෙන් නොදකී. පරාර්ථයත් නියම ආකාරයෙන් නොදනී. නොදකී. උභයාර්ථයම නියම ආකාරයෙන් නොදනී, නොදකී.සිතේ නොසන්සුන් කම පවතින විට සාමාන්‍ය ජනයා පවසන්නේ "ඔළුව අවුල් වෙලා, මට කිසිවක් සිතා ගන්නට බැහැ" යනුවෙනි. යම් කෙනෙකුට තනිකම, පාළුව, බර ගතිය, අඳුරු බව සිතෙහි පහළ වන්නේ මෙවිටය. එවිට තමාට හිත පිණිස හෝ අන් අයට හිත පිණිස යමක් කිරීමට නොවැටහේ. නොදකී

බුදුරජාණන් වහන්සේ නැවත දේශනා කරති. "බමුණ, අනෙක් කරුණක් ද දේශනා කරමි. යම් කලෙක විචිකිච්ඡාවෙන් මඩනා ලද සහ සිතින් යුතු වෙසේද ආත්මාර්ථය නියම ආකාරයෙන් නොදනී. නොදකී. පරාර්ථයද නියම අයුරින් නොදනී, නොදකී. උභයාර්ථයම නොදනී, නොදකී. දිගු කලක් පුරා හදාළ මන්ත්‍ර පවා නොවැටහේ. නොහදාළ මන්ත්‍ර ගැන කුමක් කියන්නද ? බමුණ, යම්සේ දිය බඳුනක් කැළඹුනේ, නොසන්සුන් වූයේ මඩවූයේ, අඳුරෙහි තබන ලද්දේවේද, එවිට ඇස් ඇති පුරුෂයෙක් එම දිය බඳුනෙහි මුහුන බැලුවත් නියම ආකාරයෙන් නොදන්නේය. නොදක්නේය.



www.buddhismforyou.org

එසමයෙහි ආත්මාර්ථය තතුසේ නොදනී, නොදකී. පරාර්ථයත් තතුසේ නොදනී, නොදකී. උභයාර්ථයම තතු සේ නොදනී, නොදකී. දිගු කලක් මුළුල්ලෙහි හදාළ මන්ත්‍ර පවා නොවැටහේ. නොහදාළ මන්ත්‍ර ගැන කුමක් කියන්නද ? බමුණ, යම් හෙයකින් ඇතැම් දිනෙක දිගු කලක් මුළුල්ලෙහි නොහදාල මන්ත්‍ර තබා හදාළ මන්ත්‍ර පවා නොවැටහේ නම් එයට මේ හේතුන්ය. ප්‍රාත්‍ය යෝය."

මෙහි විචිකිච්ඡාව ලෙස සඳහන් කළේ සැකයයි. එනම් කරුණු අටක් කෙරේ ඇතිවන සැකයයි. 1) ශාස්තෘවරයාණන් වහන්සේ කෙරෙහි ඇතිවන සැකය 2) ධර්මය කෙරේ ඇතිවන සැකය 3) සංඝයා කෙරේ ඇතිවන සැකය 4) සිලය කෙරේ ඇතිවන සැකය 5) අතීත භවය කෙරේ ඇතිවන සැකය 6) අනාගත භවය කෙරේ ඇතිවන සැකය 7) අතීත අනාගත භවය කෙරේ ඇතිවන සැකය 8) පටිච්ච සමුප්පාද ධර්මය කෙරේ ඇතිවන සැකය යනුවෙනි. මේ ආදී සැක සහිත හිතකින් පීඩිත වූ විට තමාගේ හෝ අන් අයගේ යහපත පිළිබඳ සිතිය නොහැකිය. කැළඹුනු සහ මඩ සහිත ද අඳුරේ තබා ඇති දිය බඳුනෙහි මනාසේ මුහුන බැලිය නොහැකිසේ හොඳ නරක, කුසල් අකුසල් හෝ කළ යුතු නොකළ යුතු ක්‍රිය පිළිබඳ අවබෝධයක් නොදැනේ. එනම් යහපත් වූ මාර්ගය නොදකී. මෙවැනි සැකයෙන් යුතු අයගේ ක්‍රියා, වචන නිසා බොහෝ කෙනෙකුට අවැඩ සිදුවෙයි. එවැනි අය ගැන නුවණ ඇත්තන් විසින් හඳුන්වන්නේ "මෙලොව පරලොව ගැන අවබෝධයක් නැති පාපකාරී මිනිස්සු" යනුවෙනි. එවැනි අය ජන සමාජයේ, දුසිල්වත්, කපටි, දඩබ්බර, පස්පව් හා දස අකුසල් වලට යොමු වූ, රාගයෙන් පිරිනු සහ ද්වේෂ සහගත සිතින් ද දැඩි ආශාවන්ගෙන්ද යුතුව වෙසෙති. මෙම පංච නීවරණයන්ගෙන් බැහැරව සත්ත බෝධ්‍යාංග ධර්ම වැඩිය යුත්තේය.

බුදුරජාණන් වහන්සේ දේශනා කරති. "බ්‍රාහ්මණය, සත්ත බෝධ්‍යාංග ධර්මයෝ සිත නොඅවුරන්නෝය. නොවසන්නෝය. සිත නොකෙලෙසන්නෝය. සති, ධම්මවිචය, විරිය, පීති, පස්සද්ධි, සමාධි, උපේක්ඛා නම් වූ බෝධි අංග ධර්මයෝ වඩන ලද්දාහු, බහුල කරන ලද්දාහු චතුරාර්ය සත්‍ය ධර්ම අවබෝධය පිණිස හේතුවෙති. සතුටට පත් සංගාරව බ්‍රාහ්මණයා විසින් අද පටන් තමා තෙරුවන් සරණ ගිය උපාසකයෙක් ලෙස පිළිගන්නට යයි ඉල්ලා සිටියේය. මෙම උතුම් සූත්‍ර දේශනාවට අනුව පංච නීවරණ ධර්මයන්හි නිස්සාරණය දැන සත්තබෝධ්‍යාංග ධර්ම වඩා උතුම් විජ්ජාවිමුක්ති ඵල නම් වූ චතුරාර්ය සත්‍ය ධර්ම අවබෝධය පිණිස කටයුතු කරමු.

ඔබ සැමට උතුම් චතුරාර්ය සත්‍ය ධර්මයම අවබෝධ වේවා
උතුම් නිර්වාණාවබෝධයම වේවා !

බත්තරමුල්ල පන්නිපිටිය පාරේ සිරි සුදස්සනාරාම සදහම් සෙනසුනෙහි ප්‍රධාන අනුශාසක
ආචාර්ය පූජනීය **මිරිස්සේ ධම්මික ස්වාමීන් වහන්සේ** විසිනි.

**ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ සේවයේ යෙදී සිට මියගිය සියළු දෙනාම සුගතියෙන් සුගතියට පත්වීමට මේ පින හේතුවේවා ! එතෙර රැකියාවෙහි නිරතවන සියළුම සංක්‍රමණික සේවකයින්ට ද දැනට සේවයේ යෙදී සිටින සභාපතිතුමා ඇතුළු සියළු කාර්ය මණ්ඩලයටද නිරෝගී සුව දීර්ඝායුෂ පැතීම සඳහා බෞද්ධ සංගමය පිරිනමන දහම් පඬුරකි**

**ඔබේ මියගිය ඥාතීන් සිහිපත් කර මෙම සදහම් පත්‍රිකාව මුද්‍රණය කිරීමට ඔබට දායක විය හැක.**
**දුරකථන : 011 2864134**



www.buddhismforyou.org